**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය - 2010**

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (ශ්‍රී.ලං.ගි.ප්‍ර.)
----------------------------------------------------------------------

| ශ්‍රී.ලං.ගි.ප්‍රමිතවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 | එක් වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් සඳහාද පාරිතෝෂික වෙන් කිරීම් කල යුතු වුවද, වර්ෂ 1-5 අතර, සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයන් 24 දෙනෙකු සඳහා රු. 675,330 ක් පාරිතෝෂික වෙන් කිරීම් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18 | වත්කම් මිලදීගත් දින සිට ක්ෂය කිරීම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී මිලට ගත් රු. 21,420,178 ක් වටිනා වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි. |

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ගබඩාවේ තිබූ රු. 414,951 ක් වටිනා භාණ්ඩ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලාංඡන සහ ප්‍රමිති සහතික වලට අදාල ඉන්වොයිස් නිකුත් නොකිරීම නිසා ලැබිය යුතු වාර්ෂික ගාස්තු ගිණුම්ගත වී නොතිබුණි.

1.2.3 නොසැසඳුනු ගිණුම්

විගණනයට ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ හා ඊට අදාල ලෙජර් ගිණුම්/ උපයෝගි ලේඛනවල දැක්වෙන ශේෂ අතර, පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | ලෙජර් ගිණුම/ උපයෝගි ලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| උත්සව අත්තිකාරම් | 224,731 | 192,500 | 32,231 |
| ආපදා ණය | 26,957,269 | 26,955,862 | 1,407 |
| පුහුණු පාඨමාලා ආදායම් | 19,317,164 | 19,325,164 | 8,000 |
| බයිසිකල් ණය | 93,046 | 87,150 | 5,896 |

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 5,144,788 ක් වන වෙළඳ ණයගැති ගිණුම් 35 ක් සඳහා ශේෂ සනාථ කර නොතිබුණි.

(ආ) හිඟ හිට ඇති පාඨමාලාවලට අදාල සහතික පත්‍රද නිකුත් කර ඇති බැවින් රු. 379,180 ක් වන පුහුණු පාඨමාලා ආදායම් අයකර ගැනීම අවිනිශ්චිත වී තිබුණි.

(ඇ) විදේශ ගමන් සඳහා වැඩිපුර ගෙවන ලද රු. 8,400 ක් වන අනියම් දීමනා මුදල් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රමිති ලාංඡනය භාවිතා කිරීම වෙනුවෙන් අය විය යුතු රු. 853,007 ක් වන වාර්ෂික ගාස්තු වර්ෂ 05 කට වැඩි කාලයක සිට හිඟව පවතී.

(ඉ) රු. 492,446 ක් වන වෙළඳ ණයහිමි ශේෂ 9 ක් සඳහා ශේෂ සනාථ කර නොතිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ලී බඩු හා උපකරණ | 9,961,546 | එක් එක් වත්කමෙහි වර්ෂය අවසානයට ශේෂය දැක්වෙන උපලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| කාර්යාල උපකරණ | 53,145,481 | |
| විද්‍යාගාර උපකරණ | 542,171,283 | |
| විද්‍යාගාර ලී බඩු | 3,942,687 | |
| පුස්තකාල පොත් | 15,049,541 | |

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය. | | ගිණුම් වර්ෂය අවසාන වී මාස 10 ක් ඇතුලත වාර්ෂික වාර්තා සභාගත කළ යුතු වුවත් 2010 දෙසැම්බර් 31 දින වන විටද වාර්ෂික වාර්තා සභාගත කර තිබුණේ 2007 වර්ෂය සඳහා පමණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.3 ඡේදය සහ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය. | i. | පැමිණීම පදනම් කරගෙන දිරි දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 6,094,000 ක් වැය කර තිබූ අතර, මෙම ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| | | ii. | දිරි දීමනා ගෙවීමේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් පුහුණුව සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් 05 දෙනෙකුටද රු. 20,000 බැගින් අනුමැතියකින් තොරව රු. 72,525 ක් ගෙවා තිබුණි. |
| | | iii. | වැටුප් රහිත නිවාඩු 10 ක් හෝ ඊට වඩා ලබා ගන්නා නිලධාරීන්ට දිරි දීමනා හිමි නොවුවද ආයතනයේ අර්ධ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු දින 84 ක් ලබා ගත් නිලධාරීන් දෙදෙනෙකුටද රු. 40,000 ක් බැගින් රු. 80,000 ක දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. |
| | 4.2.2 ඡේදය | | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ රැස්වීම් 4 ක් පමණි. |
| (ඇ) | 2001 ජුලි 02 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක එම්එෆ්/ජීඒ2/චක්‍රලේඛ/2001/03 දරන චක්‍රලේඛය. | | විදේශ සංචාරවලට සහභාගි වන නිලධාරීන් තිදෙනෙකු විසින් පුහුණුවට අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 මාර්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක එම්එෆ්/ටීආර්/1/2003 හා 2004 අගෝස්තු 31 දිනැති අංක 353/5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | කුලී වාහන මිලදී ගැනීමේදී මාසික කුලිය රු. 40,000 ඉක්මවන අවස්ථාවලදී ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ කුලී පදනම මත ලබා ගත් වාහන 04 ක් සඳහා එකී අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඉ) | 2005 ජනවාරි 31 දිනැති අංක පීඊඩී/28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | කුලී වාහන යොදවා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඊ) | 2005 ජනවාරි 31 දිනැති අංක බීඩීඒ/96/1/457 දරන ජාතික අයවැය චක්‍රලේඛය. | 2005 වර්ෂයේදී සුනාමි ආධාර වශයෙන් එකතු කළ රු. 125,894 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකර ආයතනය වෙත රඳවාගෙන තිබුණි. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ 2003 සැප්තැම්බර් 01 දිනැති පොදු බලපත්‍ර කොන්දේසි | බලපත්‍රයක් තහනම් කළ විට රජයේ ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල මේ පිළිබඳව දැන්වීමක් පල කළයුතු වුවත් අහෝසි කළ බලපත්‍ර සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙය අත්‍යාවශ්‍ය කාර්යයක් නොවන බව සභාපති වරයා දැනුම් දී තිබුණි. |
| (ඌ) | රජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.)<br>(i) මු.රෙ. 271 (2) | නොගෙවන ලද වැටුප් හා වේතන තිබේ නම් ඒවා දින 14 ක කාලයක් අවසානයේ අධිභාර ගිණුමට, ආදායමට හෝ වෙනත් නියමිත ගිණුමකට බැර කර අවසන් කළ යුතු නමුත්, රු. 51,660 ක් වූ එවැනි නොගෙවූ වැටුප් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 757 (2) | සෑම වර්ෂයකම පවත්වනු ලබන භාණ්ඩ සමීක්ෂණයෙහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2009 හා 2010 වර්ෂයන්හි භාණ්ඩ සමීක්ෂණ වාර්තා එසේ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

1.2.7 අධිකාර බලයෙන් තොර ගනුදෙනු

------------------------------------

වාර්ෂික තොග සමීක්ෂණයේදී හෙළිදරව් වූ රු. 21,548 ක තොග ඌනතාවය හා රු. 15,576 ක තොග අතිරික්තය විධිමත් අනුමැතියකින් තොරව ආදායම් සහ වියදම් ගිණුමට ගෙන තිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

2.1.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු. 95,956,902 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී අතිරික්තය රු. 49,915,902 ක් වූ හෙයින් අතිරික්තය රු. 46,041,000 කින් වර්ධනය වී තිබුණි. ආදායම රු. 66,168,998 කින් වැඩිවීම හා මෙහෙයුම් වියදම රු. 20,684,588 කින් අඩුවීමත්, පුනරාවර්තන ප්‍රදාන ලබා නොගැනීමත් මෙම වර්ධනයට හේතු වී තිබුණි.

2.1.2 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවිධිමත් ලෙස තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දීම පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ආනයන පරීක්ෂාව /තත්ත්ව සහතිකරණය පිළිබඳ පරිපාටියේ 1.1.4 ඡේදය අනුව පරීක්ෂණ වාර්තාවක් නොමැතිව වරායෙන් භාණ්ඩ නිදහස් කරගත නොහැකි නමුත් අවිධිමත් ලෙස නිකුත් කළ ප්‍රමිති සහතිකයක් උපයෝගි කරගෙන ටින් මාළු තොගයක් නිදහස් කරගෙන තිබුණි.

(ii) මෙම ටින් මාළු තොගයට අදාල පරීක්ෂණ සඳහා නියැදි ලබාගැනීමටත් පෙර ප්‍රමිති පරීක්ෂණ නිලධාරියෙකු විසින් ආනයනකරු භාණ්ඩ නිදහස් කර ගත හැකි වන පරිදි ආනයනකරුගේ පිටපත පමණක් සහතික කර ලබාදී තිබුණි.

(iii) නියැදි පරීක්ෂාවකදී මෙම ටින් මාළු තොගය ආහාරය සඳහා නුසුදුසු තත්ත්වයේ පවතින බව සනාථ වී ඇති අතර, ඒ වන විටත් ටින් මාළු තොගයෙන් කොටසක් වෙළඳපලට නිකුත් කර තිබුණි.

(ආ) ලබාගත් අත්තිකාරම් 05 ක් පමණ නොපියවා තිබියදී නිලධාරියෙකුට තවත් අත්තිකාරම් ලබාදී තිබුණ අතර, අත්තිකාරම් පියවීම සඳහා ඉදිරිපත් කල බිල්පත් පරීක්ෂාවේදී අත්තිකාරම් ලබාගත් දිනට පෙර දිනැති බිල්පත් ඉදිරිපත් කර තිබූ බවද නිරීක්ෂණය විය.

(ඇ) 2009 නොවැම්බර් 17 දින විදේශ චාරිකාවක් යාම සඳහා වැඩිපුර ලබාදී ඇති රු. 20,169 ක අත්තිකාරම් මුදල අදාල නිලධාරියා විසින් නොපියවා තිබූ අතර, ජර්නල් සටහන් මගින් විදේශ පුහුණු ගිණුමට මාරු කර තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

2.2.1 භෞතික කාර්ය සාධනය

---------------------------

වාර්ෂික ක්‍රියාකාර සැලැස්මේ දක්වා ඇති අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| අයිතමය | ඉලක්කය | තථ්‍ය කාර්යසාධනය |
| --- | --- | --- |
| ඉංජිනේරු ප්‍රමිති | i. ප්‍රමිති ප්‍රවර්ධන සම්මන්ත්‍රණ 08 ක් පැවැත්වීම. | සම්මන්ත්‍රණ පවත්වා නැත. |
| | ii. ජාතික ප්‍රමිති 18 ක් සකස් කිරීම. | 16 ක් සකස්කර ඇත. |
| | iii. ජාත්‍යන්තර ඉංජිනේරු ප්‍රමිති 25 ක් අදාල කර ගැනීම. | 12 ක් පමණක් අදාල කර ගෙන ඇත. |
| | iv. ජාතික ඉංජිනේරු ප්‍රමිති 22 ක් නැවත සකස් කිරීම. | 01 ක් පමණක් සකස් කර ඇත. |
| පුහුණු කිරීම් | දුරස්ථ ඉගෙන්වීමේ වැඩ සටහන් 02 ක් පැවැත්වීම. | දුරස්ථ ඉගෙන්වීමේ වැඩසටහන් පවත්වා නැත. |
| තත්ත්ව සහතික කරණය | කපු අපනයන නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික 04 ක් නිකුත් කිරීම. | කපු නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික නිකුත් කර නොතිබුණි. |
| විද්‍යාත්මක ප්‍රමිති | ජාතික ප්‍රමිති 17 ක් සකස් කිරීම. | 05 ක් සකස් කර ඇත. |
| | ජාත්‍යන්තර විද්‍යාත්මක ප්‍රමිති 112 ක් අදාල කර ගැනීම. | 45 ක් පමණක් අදාල කර ගෙන ඇත. |
| විද්‍යාගාර සේවය | බාහිර සේවාදායකයින්ට පරීක්ෂණ වාර්තා 3400 ක් නිකුත් කිරීම. | 1,433 ක් නිකුත් කර ඇත. |

2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පුස්තකාල පරිපාලනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාලයෙන් බැහැර ගෙනයාමට නිලධාරීන්ට දුන් පොත්වලින් පොත් 368 ක් 2011 මාර්තු 31 වන තුරුත් භාරදී නොතිබු අතර එයින් සමහර පොත් 1990 වර්ෂට අදාලව තිබුණි.

(ආ) ආයතනයේ ඇතැම් නිලධාරීන් පුස්තකාලයට ලද පොත් 151 ක් එම පොත ලද දින සිටම දීර්ඝ කාලයක් තිස්සේ පරිහරණය සඳහා ලඟ තබාගෙන තිබුණි.

(ඇ) බාහිර පුද්ගලයන්ට පුස්තකාලයෙන් පොත් නිකුත් කිරීමේදී රු. 1,500 ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් ලබාගත යුතු වුවද එසේ තැනපතුවක් ලබා නොගෙන රු. 130,000 ක් වටිනා පොත් 15 ක් 2002 සිට 2007 දක්වා වර්ෂවල ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආපසු ලබාදී නොතිබුණි.

(ඈ) ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල්වරයා වෙත 1993 සිට 2010 දක්වා කාලය තුළ පොත් 99 ක් පුස්තකාලයෙන් ලබාදී තිබූ අතර, 2011 ජනවාරි 31 දින වන විටත් ඒවා ආපසු භාරදී නොතිබුණි.

(ඉ) 2008 වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේදී පුස්තකාල පොත් 56 ක ඌනතාවයක් අනාවරණය වී තිබුණු අතර, එම පොත්වල වටිනාකම වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------
කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ආයතනවල පද්ධති සහතික කරණය සඳහා රු. 30,329,577 ක ප්‍රතිපාදන සලසා දී තිබුණද එයින් රු. 4,245,575 ක මුදලක් වෙනත් වියදම් සඳහා වැය කර තිබුණි. පලමු සහ දෙවන අදියර මගින් පිළිවෙලින් ආයතන 11 හා 19 කට අරමුදල් ලබාදී තිබුණද එයින් සහතික ලබාගෙන තිබුණේ පිළිවෙලින් ආයතන 09 ක් සහ 15 ක් පමණි

2.2.4 සේවක මණ්ඩල කළමනාකරණයේ දුර්වලතා
-----------------------------------------------
සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආයතනයේ ඉහළ විධායක තනතුරු 07 ක පුරපපාඩු පැවති අතර, එයින් සමහර තනතුරු 2004 වර්ෂයේ සිටම පුරප්පාඩු වී තිබුණි.

2.2.5 විගණන හා කළමනාකරණ කමිටුවල ක්‍රියාකාරීත්වය
-------------------------------------------------------
2010 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පත්කර නොතිබුණි.

3. පද්ධති හා පාලන
--------------------
විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) මානව සම්පත් කළමනාකරණය
(ආ) පුස්තකාල පරිපාලනය
(ඇ) තොග පාලනය
(ඈ) ණයගැති පාලනය
(ඉ) භාණ්ඩ සමීක්ෂණය
(ඊ) ආනයන පරීක්ෂාව
(උ) අත්තිකාරම් ගෙවීම්
(ඌ) ඉන්වෙන්ට්‍රි ලේඛන පැවැත්වීම